සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/02/Ad/01/පොදු | ............ | 2023.03.02 |

සියළුම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>2023 වර්ෂයේ පළාත් පාලන මැතිවරණයට තරඟ කරන අපේක්ෂකයින් සඳහා නිවාඩු අනුමත කිරීම සම්බන්ධවයි.</u>**

2023 වර්ෂයේ පළාත් පාලන මැතිවරණය සඳහා තරඟ කරන අපේක්ෂකයන්ට නාම යෝජනා භාරදීම සඳහා 2023.01.18 දින සිට 2023.01.21 දින දක්වා කාලය ලබාදී තිබුණි. මෙම කාලසීමාව තුළ දී නාමයෝජනා භාර දුන් අපේක්ෂකයන් සඳහා නිවාඩු අනුමත කිරීමේ දී ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ 2:3:2 වගන්තිය ප්‍රකාරව නාම යෝජනා භාරගන්නා දිනට පෙර දින සිට මැතිවරණය පැවැත්වෙන දිනය දක්වා වූ කාලයට වැටුප් රහිත නිවාඩු අනුමත කළ හැකිය.

02. එසේම නිලධාරියාගේ පවත්නා වර්ෂයේ ඉතිරි සාමාන්‍ය නිවාඩු ද ඔහුට ලබාගත හැකිබව සඳහන් වේ. එසේ ලබාගත හැකි නිවාඩු සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ඉල්ලා යැවූ ලිපියට පිළිතුරු ලෙස එවා ඇති, ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST-3/POLIC/04/0061 හා 2023.02.20 දිනැති ලිපියට අනුව සාමාන්‍ය නිවාඩු ලෙස පවත්නා වර්ෂයේ අනියම්, විවේක හා සමුච්චිත නිවාඩු ඇතුළත් වන බව සඳහන් කර ඇත. මෙහි දී සමුච්චිත නිවාඩු වශයෙන් හඳුන්වන්නේ පවත්නා වර්ෂයට පෙර වර්ෂයේ ඉතිරි විවේක නිවාඩු වන අතර, එම නිවාඩු ද නිලධාරියාට ලබාගත හැකිය. විවේක නිවාඩු ලබාදීමේ දී ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 8:8 වගන්තිය කෙරෙහි අවධානය යොමු කරණ ලෙස දැනුම් දෙන අතර, කණිෂ්ඨ සේවකයන් සඳහා අනියම්, අසනීප නිවාඩු වශයෙන් ලබාදීමට කටයුතු කළ යුතුවේ.

03. ඉහත කරුණ අනුව නිලධාරියෙකුගේ ඉල්ලීම මත වැටුප් රහිත නිවාඩු හෝ සාමාන්‍ය නිවාඩු ඔහුට ලබාගැනීමට ඉඩ දිය යුතුය. ඒ අනුව, ඔබ දිස්ත්‍රික්කයේ මැතිවරණයට තරඟ කරන අපේක්ෂකයන් සඳහා නිවාඩු අනුමත කිරීමේ දී ඉහත උපදෙස් පරිදි ඔබගේ නිර්දේශ සමඟ මා වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. ප්‍රධාන ගණකාධිකාරී - දැ.ගැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.
4. අධ්‍යක්ෂ (ආයතන / පාලන) - දැ.ගැ.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

Tel- / Fax - / E-mail-

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
011-2872202
011-2889002
dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
0112872202
Hot Line: 011- 2887722